# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2005 අංක 19 දරන සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනත

---

**[සහතිකය සටහන් කළේ 2005 ජුනි මස 15 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 ජුනි මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 10.75 යි. තැපැල් ගාස්තුව : රු.5.00 යි

# 2005 අංක 19 දරන සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනත

[සහතිකය සටහන් කළේ 2005 ජුනි මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 52/2004

**සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම යනුවෙන් හඳුන්වනු ලබන පදනමක් පිහිටුවීම සඳහා ද, එහි අරමුණු හා බලතල නිශ්චය කර දැක්වීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :— ලුහුඬු නාමය.

**1**. මේ පනත 2005 අංක 19 දරන සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

### සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පිහිටුවීම

සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පිහිටුවීම.

**2**. (1) අභාවප්‍රාප්ත සෞම්‍යමූර්ති තොණ්ඩමන් මහතා අනුස්මරණය කිරීම අවිච්ඡින්නව පවත්වාගෙන යාම සඳහා, (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම යනුවෙන් හඳුන්වනු ලබන පදනමක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) පදනම, (1) වන උපවගන්තිය මගින් ඊට පවරා දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, ඒ නාමයෙන් එය විසින් සහ එයට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය.

පදනමේ කළමනාකරණ මණ්ඩලය.

**3**. (1) පදනම, පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය :—

(අ) වතු යටිතල පහසුකම් පිළිබඳ විෂය භාර අමාත්‍යවරයා ;

(ආ) විපක්ෂ නායකවරයා ;

(ඇ) ස්වකීය ජීවිත කාලය තුළ දී, ආරුමුගම් තොණ්ඩමන් මහතා සහ ඉන් පසුව, අභාවප්‍රාප්ත සෞම්‍යමූර්ති තොණ්ඩමන් මහතාගේ ජීවත්ව සිටින වැඩිමලම පැවතෙන්නා :

එසේ වුව ද, ආරුමුගම් තොණ්ඩමන් මහතා, යම් කාල සීමාවක් සඳහා නිල බලයෙන් මණ්ඩලයේ සාමාජිකයකු වී සිටී නම්, අභාවප්‍රාප්ත සෞම්‍යමූර්ති තොණ්ඩමන් මහතාගේ ජීවත්ව සිටින වැඩිමල් ම පැවතෙන්නා, ඒ කාල සීමාව තුළ, මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් සේවය කළ යුතු ය :

එසේ ම තවදුරටත්, ජීවත්ව සිටින වැඩිමල් ම පැවතෙන්නා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස සේවය කිරීමට අකමැති නම් හෝ ඒ තැනැත්තාට මණ්ඩලයේ සාමාජිකයකු ලෙස සේවය කිරීමට නොහැකි නම් ජීවත්ව සිටින ඊළඟ වැඩිමල් ම පැවතෙන්නා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් සේවය කළ යුතු ය ;

(ඇ) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ අනුයෝජිතයකු ;

(ඉ) වතු යටිතල පහසුකම් පිළිබඳ විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ අනුයෝජිතයකු ;

(ඊ) ලංකා කම්කරු කොන්ග්‍රසයේ මහ ලේකම්වරයා හෝ ඔහුගේ අනුයෝජිතයකු ;

(උ) ප්‍රජාවගේ ජීවන තත්ත්වයන්, සංස්කෘතික හා සමාජයීය සංවර්ධනය නංවාලීමට කැප වූ හා බැඳුණු, පිළිගත් ශක්‍යතාවකින් හා විශිෂ්ටත්වයකින් හෙබි තැනැත්තන් අතුරෙන් ආරුමුගම් තොණ්ඩමන් මහතා විසින් ඔහුගේ ජීවිත කාලය තුළ පත්කරනු ලබන සහ ඉන් පසුව මණ්ඩලය විසින් පත්කරනු ලබන තැනැත්තන් දෙදෙනකු ;

(2) (අ) (1) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ පත්කරන ලද සාමාජිකයකුට තත්කාර්ය සඳහා මණ්ඩලය අමතා යවනු ලබන ලිපියක් මගින්, ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය ;

(ආ) (1) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ පත්කරන ලද සාමාජිකයකු, මණ්ඩලය විසින් හේතු දක්වා කවර අවස්ථාවක දී වුව ද, ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය;

(ඈ) (අ) සහ (ආ) ඡේදවල විධිවිධානවලට යටත්ව, (1) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ පත්කරන ලද සාමාජිකයකුගේ ධුර කාලය, ඔහුගේ පත්වීමේ දින සිට අවුරුදු තුනක් විය යුතු ය;

(ඈ) කාලය ගෙවීයාම නිසා ධුරය හිස්කරන, (1) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ පත්කරන ලද සාමාජිකයකු, නැවත පත්කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(3) පළමුවන උපවගන්තියේ (අ), (ආ), (ඈ), සහ (ඉ) ඡේදවල සඳහන් සාමාජිකයකු, මණ්ඩලයේ සාමාජිකයකු වී ඇත්තේ යම් ධුරයක් දැරීම ප්‍රකාරව ද, ඒ ධුරය දරන තාක්කල් ඔහු මණ්ඩලයේ ධුරය දැරිය යුතු ය.

(4) මණ්ඩලයේ සභාපතිවරයා, අමාත්‍යවරයා විය යුතු අතර, මණ්ඩලයේ යම් රැස්වීමකට අමාත්‍යවරයා නොපැමිණි විටක දී, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ රැස්වීම සඳහා, ඔවුන් අතුරෙන් සභාපතිවරයකු තෝරා පත්කරගනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය.

(6) පස් වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්, මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කිරීම පිළිබඳ කාර්ය පරිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

(7) මණ්ඩලය විසින්, එහි සාමාජිකයන් අතර පුරප්පාඩුවක් හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් තිබුණේ වුව ද, එය නොතකා කටයුතු කරනු ලැබිය හැකි ය.

4. පදනමේ මුද්‍රාව— පදනමේ මුද්‍රාව.

(අ) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි යම් තැනැත්තකු භාරයේ තැබිය යුතු ය ;

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය ;

(ඇ) මණ්ඩලයේ අනුදැනුම ඇතිව හා තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ලේඛනයට අත්සන් තැබිය යුතු, මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, කිසිම ලේඛනයකට නොතැබිය යුතු ය.

පදනමේ අරමුණු.

**5**. පදනමේ අරමුණු පහත දැක්වෙන පරිදි වන්නේ ය :—

(අ) ශ්‍රී ලංකාවේ සියලු ප්‍රජාව අතර සාමය, හොඳහිත, අවබෝධය සහ සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම ;

(ආ) ජාතීන් අතර එකමුතුකම සහ සමාජ සංකලනය ප්‍රවර්ධනය කිරීම හා ධෛර්යමත් කිරීම ;

(ඇ) ශ්‍රී ලාංකිකයන්ගේ ආගමික, අධ්‍යාපනික, වෘත්තීය, සමාජ, දේශපාලන, ආර්ථික, සෞන්දර්යාත්මක හා භෞතික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) ශ්‍රී ලාංකිකයන්ගේ ආර්ථික, දේශපාලන, අධ්‍යාපනික, සංස්කෘතික, සමාජයීය හා සෞන්දර්යාත්මක ක්ෂේත්‍රවල දැනීම හා අවබෝධය නංවාලීම ;

(ඉ) ආර්ථික වශයෙන් හා සමාජයීය වශයෙන් අවාසියට ලක් වූ යම් තැනැත්තකුගේ වාසස්ථාන වැඩිදියුණු කිරීම සහ යටිතල පහසුකම් සැපයීම ද ඇතුළුව ජීවන තත්ත්වයන් වැඩිදියුණු කිරීම ;

(ඊ) උචිත බැංකුවල හා මූල්‍ය ආයතනවල ආයෝජනය කිරීමට ශ්‍රී ලාංකිකයන් ධෛර්යමත් කිරීම ;

(උ) පදනමේ අරමුණුවලට සමාන අරමුණු ඇත්තා වූ දේශීය හා විදේශීය ආයතන සමග සබඳතා ඇතිකර ගැනීම ;

(ඌ) පදනමේ පරමාර්ථ කිසිවකට සමාන යම් කටයුත්තක නිරතව සිටින යම් තැනැත්තකුට මූල්‍ය හෝ වෙනත් ආධාර සැපයීම ;

(එ) ශ්‍රී ලංකාව තුළ හා විදේශයන්හි ආර්ථික, දේශපාලන, අධ්‍යාපනික, සංස්කෘතික සහ සමාජයීය ක්ෂේත්‍ර පිළිබඳව, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම ;

(ඒ) ශ්‍රී ලාංකිකයන් අතර මානව අයිතිවාසිකම්, යුතුකම් හා යුක්තියට ප්‍රවේශවීම ආදිය පිළිබඳව දැනීමක් ඇතිකිරීම සඳහා වූ වැඩසටහන් සංවිධානය කිරීම ;

(ඔ) ශ්‍රී ලාංකිකයන්ගේ ක්‍රීඩා හා විනෝදාංශ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයීම ;

(ඕ) පදනමේ පරමාර්ථ ඊකගැනීම සඳහා සහ සුදුසු යයි මණ්ඩලය සලකන වෙනත් යම් කාර්යයක් සඳහා, රම්බොඩ තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානය, නෝවුඩ් හි තොණ්ඩමන් ක්‍රීඩා සංකීර්ණය හා හැටන් හි තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙන යාම හා ප්‍රයෝජනයට ගැනීම :

එසේ වුව ද, රම්බොඩ තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානය නෝවුඩ් හි තොණ්ඩමන් ක්‍රීඩා සංකීර්ණය සහ හැටන් හි තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය යම් දේශපාලන කාර්යයක් සඳහා භාවිත නොකළ යුතු ය ; සහ

(ක) ඉහත සඳහන් සියලු පරමාර්ථ හෝ ඒ අතුරෙන් යම් පරමාර්ථයක් මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික විය හැකි වෙනත් සියලු ක්‍රියා කිරීම.

පදනමේ බලතල හා කර්තව්‍ය.

**6**. මණ්ඩලයට, පදනමේ නාමයෙන් මෙහි පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :—

(අ) මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම ;

(ආ) මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ අන්‍යාකාරයකින් පදනම සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම හෝ දැරීම හා ඒ දේපළ විකිණීම, උකස්කිරීම, බදුදීම, කුලියට දීම, ප්‍රදානය කිරීම, පාවාදීම, රික්ථවරණය කිරීම, පැවරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඇ) ආර්ථික, අධ්‍යාපනික, සංස්කෘතික, සමාජයීය, සෞන්දර්යාත්මක හා ක්‍රීඩා සංවර්ධනය හා වෘත්තීය සංවර්ධන කටයුතු සඳහා ප්‍රදාන, පරිත්‍යාග හෝ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ;

(ඈ) පදනමේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසි මත ණය ලබාගැනීම ;

(ඉ) පදනමේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම හා අරමුණු ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම් හා එකඟවීම්වලට කෙළින් ම හෝ පදනමේ නිලධරයන්, සේවකයන් හෝ ලියවිල්ලකින් බලය දී ඇති අනුයෝජිතයන් මගින් හෝ එළඹීම හෝ ඒ පිළිබඳව කටයුතු ඉටුකිරීම ;

(ඊ) පදනම විසින් සපයනු ලබන සේවා හෝ පහසුකම් සඳහා ගාස්තු අයකිරීම ;

(උ) මේ පනතේ විධිවිධානවලට යටත්ව, පදනමේ අරමුණු ක්‍රියාවේ යෙදවීමෙහි ලා අවශ්‍ය වියහැකි නිලධරයන් හා සේවකයන් පත්කිරීම හා සේවයෙහි නියුක්ත කරවීම හා ඔවුනට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් සේවයෙන් පහකිරීම හා ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය කිරීම ;

(ඌ) රම්බොඩ තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානය, නෝවුඩ් හි තොණ්ඩමන් ක්‍රීඩා සංකීර්ණය සහ හැටන් හි තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය කළමනාකරණය කිරීම හා පවත්වාගෙන යාම හා ඒ මධ්‍යස්ථාන හෝ ඒවායේ යම් කොටසක් භාවිත කිරීම හෝ මහජන ප්‍රදර්ශනය සඳහා ගාස්තු අයකිරීම ;

(එ) පදනමට අයත් අරමුදල්, ඒ මුදල් ආයොජනය කිරීම සඳහා නීති මගින් බලය දී ඇති යම් ආයෝජනවල, මණ්ඩලයේ අභිමතය පරිදි ආයෝජනය කිරීම, ප්‍රත්‍යායනයනය කිරීම, ප්‍රති-ආයෝජනය කිරීම හා ඒ ආයෝජන වෙනස් කිරීම සහ ඒ ආයෝජනවලින් එකතුවන ආදායම එක්රැස් කිරීම ;

(ඒ) ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමේ දී හා ස්වකීය අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ දී පදනමට සහාය වීම සඳහා කමිටු පත්කිරීම ; සහ

(ඔ) පදනමේ අරමුණු ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය වන්නා වූ හෝ උපකාරී වන්නා වූ හෝ ආනුෂංගික වන්නා වූ සියලු දේ කිරීම.

ඇතැම් කාර්ය සඳහා පදනමට කරනු ලබන සේවය ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සැලකිය යුතු බව.

**7**. නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹී ඇති යම් තැනැත්තකු පදනම විසින් සේවයේ යොදවනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් පදනමට සේවය කරන ලද යම් කාලසීමාවක් ඒ ගිවිසුම යටතේ බැඳීම් ඉටුකිරීමේ කාර්යය සඳහා, ආණ්ඩුව වෙත සේවය කරන ලද කාලසීමාවක් වශයෙන් සළකනු ලැබිය යුතු ය.

පදනමේ කාර්ය මණ්ඩලය.

**8**. (1) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් නියම හා කොන්දේසි මත, එහි කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් නිලධරයන් හා සේවකයන්, මණ්ඩලය විසින් පදනමේ කාර්ය මණ්ඩලයට පත්කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ ඉල්ලීම පිට, යම් රාජ්‍ය නිලධරයකු, ඒ නිලධරයාගේ හා රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා පදනමේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලැබිය හැකි ය.

(3) යම් රාජ්‍ය නිලධරයකු පදනමේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් රාජ්‍ය නිලධරයකු පදනමේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

රජයේ නිශ්චල දේපළ පදනම වෙත ලබාදිය යුතු බව.

**9**. පදනමේ යම් කාර්යයක් සඳහා රජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වන්නා වූ අවස්ථාවක, ඒ දේපළ (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ විශේෂ ප්‍රදානයක් කළහැකි හෝ බද්දක් දිය හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව පදනම වෙත ඒ දේපළ සම්බන්ධයෙන් කෙරෙන විශේෂ ප්‍රදානයකට හෝ බදු දීමකට හේ ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

## II වන කොටස

## මුදල්

පදනමේ අරමුදල.

**10**. (1) (මෙහි මින් මතු, මේ පනතෙහි "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) රම්බොඩ තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානය, නෝවුඩ් හි තොණ්ඩමන් ක්‍රීඩා සංකීර්ණය සහ හැටන් හි තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා, ශ්‍රී ලංකා ඒකාබද්ධ අරමුදලින් ප්‍රතිපාදනය කොට දැනටමත් වැය කොට ඇති, රුපියල් මිලියන දෙසිය හැත්තෑ දෙකක් වන මුදල, පදනමේ මූලික ප්‍රාග්ධනය විය යුතු ය.

(3) අරමුදලට -

(අ) මේ පනත යටතේ, ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටුකිරීමේ දී පදනමට ලැබෙන සියලු මුදල් ;

(ආ) ශ්‍රී ලංකාව තුළ දී හෝ විදේශයන්හි කවර හෝ ප්‍රභවයකින් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් පදනමට ලැබෙන සියලු මුදල් ;

(ඇ) පදනම විසින් සපයනු ලබන සේවා හෝ පහසුකම් කිසිවක් සඳහා ගාස්තු අයකිරීම මගින් ලැබෙන යම් ආදායමක් ;

(ඈ) රම්බොඩ තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානය, නෝවුඩ් හි තොණ්ඩමන් ක්‍රීඩා සංකීර්ණය සහ හැටන් හි තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හෝ එහි යම් කොටසක් මහජන ප්‍රදර්ශනය හා භාවිත කිරීම සඳහා ගාස්තු අයකිරීමෙන් ලැබෙන යම් ආදායමක් ; සහ

(ඉ) පදනමට අයවිය යුතු යම් ආදායමක්, ආයෝජන හෝ වෙනත් ලැබීම්,

ගෙවනු ලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ ස්වකීය බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටුකිරීමේ දී, මණ්ඩලය විසින් දරනු ලබන යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් ප්‍රමාණ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය.

11. (1) මණ්ඩලය විසින්, එහි ගිණුම් පොත් එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස තිස්එක් වන දිනට තුලනය කරනු ලැබිය යුතු අතර, ඉන් පසුව එළඹෙන පෙබරවාරි මාසයේ අවසාන දිනයට පසු නොවන දිනයක දී, ලාභ හා අලාභ ගිණුමක් සහ ඉහත සඳහන් කළ දිනය දක්වා සකස් කරන ලද, මණ්ඩලයේ වත්කම් හා බැරකම් පිළිබඳ සාරාංශයක් ඇතුළත් ශේෂ පත්‍රයක් පිළියෙල කර, ඒ ගිණුම් හා ශේෂ පත්‍රය පිළියෙල කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධරයා විසින් අත්සන් කරන ලදුව ඉදිරිපත් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) පදනමේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු ය.

**12**. මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත ප්‍රකාර අවසර දී ඇති යම් ප්‍රමාණයකට, පදනමේ ආදායම හෝ ලාභ මත වූ යම් බද්දක් ගෙවීමෙන් පදනම නිදහස් කරනු ලැබිය යුතු ය.

පදනම බදු ගෙවීමෙන් නිදහස් කිරීම.

III වන කොටස

## පොදු විධිවිධාන

**13**. මේ පනත යටතේ වූ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලය වෙත සාමාන්‍ය හෝ විශේෂ විධාන ලිඛිතව දෙනු ලැබිය හැකි ය.

විධාන.

**14**. මණ්ඩලය විසින්, එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු මාස හයක කාලසීමාවක් ඇතුළත, ඒ වර්ෂය තුළ පදනමේ කටයුතු පිළිබඳ සම්පූර්ණ විස්තරයක් දැක්වෙන වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ වාර්තාව අදාළවන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ අවසානයට පෙර අමාත්‍යවරයා විසින් ඒ වාර්තාව පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු සැලැස්විය යුතු ය.

මණ්ඩලයේ වාර්තාව පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුතු බව.

**15**. අල්ලස් පනතේ අර්ථානුකූලව පදනම උපලේඛනගත ආයතනයක් විය යුතු අතර, ඒ පනතේ විධිවිධාන එපරිද්දෙන් අර්ථකථනය කරනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව පදනම උපලේඛනගත ආයතනයක් වශයෙන් සැළකිය යුතු බව.

**16**. මණ්ඩලයේ සියලු සාමාජිකයන් හා පදනමේ කාර්ය මණ්ඩලය දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන් සහ පදනමේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබිය යුතු බව.

**17**. (1) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත මණ්ඩලයේ යම් සාමාජිකයකු, පදනමේ නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඔහුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

මේ පනත යටතේ කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

(2) යම් අධිකරණයක් ඉදිරියේ, පදනම විසින් හෝ පදනමට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී පදනම විසින් දරන ලද යම් වියදමක් පදනමේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී පදනම වෙත ගෙවන ලද හෝ පදනම විසින් අයකර ගන්නා ලද ගාස්තු කිසිවක් පදනමේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) පළමු වන උපවගන්තියේ සඳහන් කර ඇති පරිදි, එවැනි යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත, තමා විසින් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරනු ලැබුවහොත්, ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් ඒ වියදම අයකරනු ලැබ ඇත්නම් මිස, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

රීති.

**18**. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන්, මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය :—

(අ) පදනමේ කාර්ය මණ්ඩලයේ පාරිශ්‍රමික හා විනය පාලනය, ඔවුන්ට නිවාඩු හා වෙනත් ප්‍රතිලාභ දීම ඇතුළුව ඔවුන්ගේ සේවා නියම හා කොන්දේසි ;

(ආ) පදනමේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ යෝජනා ක්‍රම සහ පත්කිරීම හා උසස් කිරීම සම්බන්ධයෙන් කාර්ය පරිපාටිය;

(ඇ) පදනමේ වාර්ෂික වැඩසටහන හා කාර්යය සැලසුම, පදනමේ වාර්ෂික අයවැය, වාර්ෂික වාර්තාව හා ගිණුම් සහ ඒ වැඩසටහන හා සැලසුම, අයවැය, වාර්තාව හා ගිණුම් පිළියෙල කළ යුතු ආකාරය ; සහ

(ඈ) මේ පනත මගින් රීති සෑදීමට නියමිත හෝ බලය දී ඇති වෙනත් යම් කරුණු .

(2) මණ්ඩලය විසින් සාදන ලද සෑම රීතියක් ම, අමාත්‍යවරයා විසින් අනුමත කර, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ පළ කරනු ලැබූ දින හෝ එහි සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

**19**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**20**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි,–

අර්ථ නිරූපණය.

"ලංකා කම්කරු කොන්ග්‍රසය" යන්නෙන්, (138 වන අධිකාරය වූ) වෘත්තීය සංගම් ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද වෘත්තීය සංගමයක් අදහස් වේ ;

" පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහනගර සභාවක්, නගර සභාවක්, ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන, කරනු ලබන හා ඉටුකරනු ලබන බලතල, කාර්ය හා කර්තව්‍යවලට අනුරූපී වන හෝ සමාන වන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කරන, කරන හා ඉටුකරන, යම් නීතියක් මගින් හෝ ඒ යටතේ ඇති කරන ලද හා පිහිටුවන ලද යම් අධිකාරියක් ඊට ඇතුළත් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.